| |
|---|
| ***සමාජ විද්‍යා තරඟාවලිය - 2023*** |
| **අකුරැස්ස අධ්‍යාපන කලාපය** |
| **පාසල් කාණ්ඩය:-200 අඩු / 201-500 / 501-1000 / 1000 ට වැඩි** |
| **ශ්‍රේණිය:- 11** |
| **කාලය:-පැය 02** |

නම:-..................................................................

- **අංක 1 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01).කොළඹ මහනුවර මහාමාර්ගය ඉදි කළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා වූයේ,

1.හෙන්රි වෝඩ් 2.රොබට් බ්‍රවුන්රිග්

3.එඩ්වඩ් බාන්ස් 4.තෝමස් මෙට්ලන්ඩ්

02).බ්‍රිතාන්‍ය ජාතිකයන් ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ වල පාලන බලය හිමිකරගත් වර්ෂය,

1.1815 2.1658

3.1796 4.1802

03).ඩී.එස්.සේනානායක මහතා සභාපති ධූරය දැරූ විධායක කාරක සභාව වනුයේ,

1.අධ්‍යාපනය 2.ස්වදේශ කටයුතු

3.පළාත් පාලනය 4.කෘෂි කර්ම හා ඉඩම්

04).ශ්‍රී ලංකාවේ මුලින්ම තේ වගාව ආරම්භ කළ බ්‍රිතාන්‍ය ජාතිකයා වන්නේ,

1.ජේම්ස් ටේලර් 2.ජෝර්ජ් බර්ඩ්

3.කැප්ටන් ඩෝසන් 4.මැක්ඩෝවල්

05).විශේෂ පාර්ලිමේන්තු පනත් මඟින් පිහිටුවා ඇති අධිකරණ ආයතනයක් වන්නේ,

1.මහාධිකරණය 2.කම්කරු විනිශ්චය සභාව

3.දිසා අධිකරණය 4.අභියාචනාධිකරණය

06).ලංකාවට සීමිත ඡන්ද බලය ලබා දුන් ප්‍රතිසංස්කරණය වන්නේ,

1.1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය 2.1920 මැනිං ප්‍රතිසංස්කරණය

3.1910 කෲමැකලම් ප්‍රතිසංස්කරණය 4.1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණය

07).මිනිසාගේ පැවැත්ම සඳහා හේතුවන ජීව උපකාරක සේවා අංගයක් වන්නේ,

1.ඛනිජ සම්පත් 2.ජල විදුලිය

3.ජීව වායු 4.හිරු එළිය

08).පසෙහි වර්ණය,සංයුතිය,පස් වර්ගය,තීරණය කරන සාධක වන්නේ,

1.මව් පාෂාණ 2.භූ විෂමතාවය

3.දේශගුණය 4.මානුෂ ක්‍රියා

09).මිනිසාගේ දෛනික අවශ්‍යතාව සඳහා පහසුවෙන් ලබා ගත හැකි මතුපිට ජලයේ ප්‍රතිශතය,

1.1% 2.20%

3.79% 4.97%

10).නිලාවේලි,පුල්මුඩේ,යන ප්‍රදේශවල බහුලව ව්‍යාප්තව ඇති ඛනිජ වැලි ප්‍රභේදය වන්නේ,

1.සර්කෝන් 2.රූටලය

3.ඉල්මනයිට් 4.සිලිකාව

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න.**

11).1814 වර්ෂයේදී.....................................වාෂ්ප බලයෙන් ක්‍රියා කරන දුම්රිය එන්ජිම නිපද වීම කාර්මික විප්ලවයේ වැදගත් සංදිස්ථානයකි.

12).පියදාස සිරිසේන මහතා නවකතා මහින්ද .................................... වැනි පුවත්පත් ඔස්සේද ලාංකිකයන් විචාරයකින් තොරව බටහිර සංස්තිය වැළඳ ගැනීම විවේචනය කළේය.

13).ශ්‍රී ලංකාවේ ප්‍රතම විධායක ජනාධිපති වූයේ............................................

14).එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ..............................................දින මානව හිමිකම් ප්‍රඥප්තිය සම්මත කර ගන්නා ලදී.

15).වර්තමාන ලෝක ජන සංඛ්‍යාව බිලියන .........................................කි.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.**

16).වර්තමානයේ ඇෆ්ගනිස්ථානයේ රාජ්‍ය බලය උසුලන ත්‍රස්තවාදී සංවිධානය නම් කරන්න.

..........................................................

17).2023 මැයි වන විට ලොව වැඩිම ජනගහනයක් ඇති රට නම් කරන්න.

..........................................................

18).2022 දී ආසියාවේ වේගවත්ම කෙටි දුර ධාවකයා ලෙස කිරුළු පැළඳූ ශ්‍රී ලාංකීය ක්‍රීඩකයා නම් කරන්න.

..........................................................

19).බෙංගාල බොක්ක හරහා හමා ගිය බංගලාදේශයට විශාල හානියක් කළ සුළි කුණාටුව නම් කරන්න.

.......................................................

20). යුක්රේනයේ වර්තමාන ජනාධිපතිවරයා කවුද?

.......................................................

- **අංක 21 සිට 25 දක්වා ප්‍රශ්නවලට පහත රූප අධ්‍යනය කර පිළිතුරු සපයන්න.**

21).



1.මෙම රූපයෙන් දැක්වෙන නිර්මාණය නම් කරන්න.

2.එය නිර්මාණය කළ තැනැත්තා කවුද?

22).



1.මෙම පින්තූරයෙන් දැක්වෙන පුද්ගලයා කවුද?

2.මොහු අයත් රජ පෙළපත කුමක්ද?

23).



1.මෙම පින්තූරයෙන් දැක්වෙන පුද්ගලයා නම් කරන්න.

2.මොහු නායකත්වය දුන් නිදහස් සටන කුමක්ද?


24).



1.මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක්ද?

2.මීට පහළින් ඇති අධිකරණ ආයතනය කුමක්ද?

25).




1.මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක්ද?

2.මෙහි A අක්ෂරයෙන් දැක්වෙන ස්තරය කුමක්ද?

- **අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට 'අ' සහ 'ආ' තීරු දෙකක් දැක්වේ.ඒවායේ සම්බන්ධතාවයන් ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

26) අ ආ

| අ | ආ |
|---|---|
| 1.සැමුවෙල් ක්‍රොම්ප්ටන් | A.බැටලු අභිජනනය ක්‍රම. |
| 2.විලියම් සීමන්ස් | B.මියුල් යන්ත්‍රය. |
| 3.ගුග්ලි මාර්කෝනි | C.යපස් උණු කිරීමේ විදුලි උඳුන. |
| 4.රොබට් බ්ලැක්වෙල් | D.ගුවන්විදුලිය නිපද වීම. |

1).BCDA 2).DCBA 3).CBAD 4).BCAD

27). අ ආ

1.ගෝව A.ප්‍රංශය

2.බතාවිය B.පෘතුගීසි

3.පොන්ඩිචෙරි C.ඉංග්‍රීසි

4.කල්කටා D.ලන්දේසි

1).BDCA 2).DCBA 3).CADB 4).BDAC

28). අ ආ

1.1924 A.ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

2.1833 B.මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

3.1910 C.කෝල්බෘක් ප්‍රතිසංස්කරණය

4.1931 D.කෲමැකලම් ප්‍රතිසංස්කරණය

1).ABDC 2).DCBA 3).BCDA 4).ACBD

29). අ ආ

1.ආභරණ සෑදීම. A.ඩොලමයිට්

2.ප්‍රතිමා සෑදීම. B.මිනිරන්

3.තීන්ත වර්ග C.දියමන්ති

4.පොහොර D.කිරිගරුඬ

1).CDBA 2).CDAB 3).DBCA 4).ABCD

30). අ ආ

1.1215 A.රුසියානු විප්ලවය

2.1776 B.මැග්නා කාර්ටා ගිවිසුම

3.1789 C.ඇමෙරිකානු විප්ලවය

4.1917 D.ප්‍රංශ විප්ලයවය

1).ABCD 2).BADC 3).ADCB 4).BCDA

- **31 සිට 35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

31).1).1848 දෙවන නිදහස් සටනට බලපෑ ආසන්නතම හේතුව කුමක්ද?

2).එම සටනට නායකත්වය දුන් ජාතික විරුවන් දෙදෙනෙකු නම් කරන්න.

3).මෙම සටන අසාර්ථක වීමට බලපෑ හේතු 3ක් ලියන්න.

32).1).බ්‍රිතාන්‍යයන් ලංකාව පාලනය කළ වසර ගණන සඳහන් කරන්න.

2).බ්‍රිතාන්‍ය පාලනය නිසා මෙරට සිදු වූ සමාජ වෙනස්කම් දෙකක් ලියන්න.

3).බ්‍රිතාන්‍ය පාලනය නිසා අප රටට උරුම වූ යහපත් අංග 3ක් ලියන්න.

33).1).1:50 000 භූමි ලක්ෂණ සිතියම් වල සමෝච්ච රේඛා අන්තරය ලියන්න.

2).එම සිතියම් මුහුණතක දැක්වෙන ප්‍රධාන භෞතික ලක්ෂණ ප්‍රභේද දෙකක් ලියන්න.

3).1:50 000 සිතියම් පත්‍රයක ප්‍රධාන කොටස් තුන නම් කරන්න.

34).1).ඍජු ප්‍රාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස ආරම්භ වූ රට කුමක්ද?

2).ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ චින්තකයන් දෙදෙනෙකු ලියන්න.

3).ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක මූලික ලක්ෂණ තුනක් ලියන්න.


35).1).මුලින් ම පුනරුදය ඇති වූ යුරෝපා රට නම් කරන්න.

2).පල්ලියේ ආධිපත්‍ය විවේචනය කළ චින්තකයන් දෙදෙනෙකු නම් කරන්න.

3).පුනුරුද සමයේ විශ්වය පිළිබඳ ව ඉදිරිපත් වූ මත තුනක් ලියන්න.

- **පහත සඳහන් ස්ථාන සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ ලකුණු කොට නම් කරන්න.**

1. හෝර්ටන් තැන්න
2. කෝට්ටේ
3. ගෝණ නදිය
4. මින්නේරිය වැව
5. දඹකොළ පටුන
6. කාවරාගාම
7. පොල්ගොල්ල වේල්ල
8. ඇතුගල්පුරය
9. රංවාමඩම
10. සීගිරිය



# LOL.lk
## BookStore



# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

**ඕනෑම පොතක් ඉක්මනින්**
**නිවසටම ගෙන්වා ගන්න**




| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**